Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික පාසල්වල විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2021

දිවයිනේ ජාතික පාසල්වල විදේශ භාෂා ඉගැන්වීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති ''Online Applications - Institutional Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (online) පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ," වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "දිවයිනේ ජාතික පාසල්වල විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2021" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2021.08.13** දින වේ.

*සටහන.-* අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමු කර, පාසල් පාදක ක්‍රමය පදනම්කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කුසලතාව මැන බැලීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ 12.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතාව මත පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේ දී පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය පත්වීම් ලබා ගැනීමට ඇති මනාපය අනුපිළිවෙළින් දැක්විය යුතුය.

*සටහන.*- එකම පාසලට ඉල්ලා ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවකදී සුදුසුකම් ලැබූවන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන නිශ්චිත ලකුණු ලබා දීමේ පටිපාටියකට අනුව සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවාගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම්කර ගෙන වන බැවින් වසර 05 ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

2.5 *පුරප්පාඩු ලේඛනය :*

| *පළාත* | *භාෂා විද්‍යාගාර සංඛ්‍යාව* | *පුරප්පාඩු සහ නවක ගුරු සංඛ්‍යාව* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *ප්‍රංශ* | *ජපන්* | *චීන* | *කොරියන්* | *හින්දි* | *ජර්මන්* |
| බස්නාහිර | 134 | 11 | 10 | 30 | 15 | 05 | 10 |
| මධ්‍යම | 155 | 10 | 10 | 25 | 15 | 05 | 15 |
| දකුණ | 110 | 10 | 10 | 40 | 20 | 05 | 15 |
| උතුර | 91 | 05 | 07 | 18 | 18 | 05 | 10 |
| නැගෙනහිර | 104 | 10 | 10 | 25 | 20 | 05 | 15 |
| වයඹ | 127 | 10 | 10 | 25 | 25 | 05 | 10 |
| උතුරු මැද | 83 | 10 | 10 | 20 | 25 | 05 | 15 |
| ඌව | 88 | 10 | 10 | 20 | 20 | 05 | 10 |
| සබරගමුව | 113 | 10 | 10 | 20 | 20 | 05 | 10 |
| එකතුව | 1005 | 86 | 87 | 223 | 178 | 45 | 110 |

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ඔබ ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත්වේ.

(v) 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුවG-E-01-2016 හි රු. 27,740-300x6-380x7-445x2-රු.33,090 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.පත්වීම්ලාභීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු. 32,200 හි පිහිටුවනු ලැබේ.වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම්:*

5.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව හා අංක අමප/19/1412/127/0 II-I හා 2019.07.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021.08.13 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලද දේශීය/ විදේශීය විශ්වවිද්‍යාලවල උපාධිය සම්පූර්ණ කරනු ලැබූ, අදාළ විෂයය (විදේශ භාෂා) උපාධියට එක් විෂයයක් ලෙස හදාරණු ලැබූ හෝ අදාළ විෂයට විශේෂ උපාධියක් ලබා තිබීම.

*සටහන-* සෑම අයදුම්කරුවකුම ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව අ.පො.ස. (සා.පෙළ.)විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් විය යුතුය.විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස.(සා.පෙළ) විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

06. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතුය. (ඒ අනුව 2003.08.13 දිනට හෝ ඊට පෙර හා 1986.08.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

07. අනෙකුත් අවශ්‍යතා :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය ;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය ;

(iii) මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

08. *විභාග කොන්දේසි :*

8.1 මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verification)සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 *විභාග පටිපාටිය :*

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් පවත්වන ස්ථානය තීරණය කරනු ලැබේ.

(ii) සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ සියලු ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ, එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට නියමිත භාෂා මාධ්‍යම විය යුතුය.

(iii) අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02)කින් සමන්විත වේ. සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙක (02)ටම පෙනී සිටිය යුතුය. සාමර්ථ්‍ය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

(v) බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

8.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

8.4 අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ

ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු,රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක්/ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ඉල්ලීම් ලිපියක් 011-2784232 දරන ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. *විභාගයට පෙනී සිටීම* :

9.1 නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කොට විභාගයට පෙනී සිටිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.*- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත් වීම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

12. *විෂයය නිර්දේශය :*

12.1 ලිඛිත විභාගය

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. සියලු අයදුම්කරුවන් එම ප්‍රශ්න පත්‍ර දෙක සඳහාම පෙනී සිටීම අනිවාර්යය වේ.

(i) අභියෝග්‍යතාව - කාලය පැය 01යි (ලකුණු 100යි)
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයක් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව, ප්‍රමාණකරණය,කාලය හා අවකාශ අතර සම්බන්ධතා වටහා ගැනීමේ ලා අපේක්ෂකයා සතු කුසලතාව මිනුම් කිරීම අපේක්ෂා කෙරේ. බහුවරණ / කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) සාමාන්‍ය දැනීම - කාලය පැය 01යි. (ලකුණු 100 යි)
ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන, තාක්ෂණික ගුරු අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසුව සිදු කරන ලද අධ්‍යාපන නවීකරණ පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

12.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

*සටහන* - ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

12.3 ප්‍රායෝගික පරීක්ෂණය :
ප්‍රායෝගික පරික්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා විනාඩි 05 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ :

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු සංඛ්‍යාව* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු සංඛ්‍යාව | 25 | 10 |

*සටහන* - ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

12.3.1 *ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :*

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි පහ (05)කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව විසි පහ (25) කි.

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 02 බැගින් ලබා ගත යුතුය.

(iv) ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

12.3.2 නිර්ණායකයන් හි අරමුණු

(i) අරමුණ හා ප්‍රවිෂ්ට වීම.
සාර්ථකව පාඩමෙ හි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ටවීමේ හැකියාව ඇගයීම.

(ii) පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

(iii) සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

13. *විභාග ගාස්තු :*

13.1 විභාග ගාස්තුව රු. 600/-කි.විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පත් මගින් (Any Bank Credit Card)

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පත් මගින් (Through any bank debit cards with internet transaction facilities)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon online Banking Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payments )

(v) තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

***සටහන*** : ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

13.2 ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

13.3 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

14. *විභාග ප්‍රතිඵල :*

14.1 ලිඛිත විභාගයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

15. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :

පහත උපලේඛන 01 භාවිත කර මාර්ගගත අයදුම්පත සකසා තිබේ.

*උපලේඛනය 01*

| *විදේශ භාෂාව* | *කේත අංකය* |
|---|---|
| ප්‍රංශ | 1 |
| ජපන් | 2 |
| චීන | 3 |
| කොරියන් | 4 |
| හින්දි | 5 |
| ජර්මන් | 6 |

16. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ අංක 14 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

17. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

18. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

19. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවේ.

20. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා,
ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.
2021 අප්‍රේල් 23 වැනි දින.